# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2024.10.30 |


## ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2024 සැප්තැම්බර්

**ඉදිකිරීම් අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ලෙස හඳුන්වනු ලබන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය 2024 සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 48.6ක් වාර්තා කළ අතර, එමගින් ඉදිකිරීම් කටයුතුවල පහළ යෑමක් පෙන්නුම් කරයි.** මැතිවරණ වාතාවරණය තුළ ඉදිකිරීම් කටයුතුවල සිදුවූ යම් ප්‍රමාදයන් හේතුවෙන්, සමස්ත ක්‍රියාකාරකම් වල සුළු පසුබෑමක් නිරීක්ෂණය කළ බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙක් විසින් සඳහන් කරන ලදී.

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)**

**48.6**

**2024 සැප්තැම්බර්**

සැප්තැම්බර් මාසයේදී නව ඇණවුම් ඉහළ යෑමක් වාර්තා විය. විදේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරගෙන යන සහ දේශීය අරමුදල් යොදාගන්නා පුද්ගලික ව්‍යාපෘති ක්‍රමිකව ආරම්භ කිරීමට ටෙන්ඩර් අවස්ථා පැවැතියද, ඒ සඳහා පවතින දැඩි වෙළඳපොළ තරඟකාරීත්වය සිය මූල්‍ය තත්වයන්ට අහිතකර ලෙස බලපෑම් ඇතිකරන බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් විසින් ප්‍රකාශ කරන ලදී. ඉදිකිරීම් කටයුතු මන්දගාමී වීම, සැප්තැම්බර් මාසයේ දී සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, සැප්තැම්බර් මාසයේදී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයේ පරිදිම ඉහළ ගියේය.

**ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** | **51.4** | **48.6** | **-** | **ඉහළ යාමක සිට පහත වැටීමක්** |
| නව ඇණවුම් | 50.0 | 52.9 | + | කඩයිම් මට්ටමේ සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.3 | 41.4 | - | වැඩි වේගයකින් පහත වැටීමක් |
| තොග මිලදී ගැනුම් | 48.6 | 44.3 | - | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.4 | 51.4 | = | සම වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ව්‍යාපෘති වෙළඳපොළ තුල සුලබ වීමත් සමඟම ඉදිකිරීම් අංශයේ ඉදිරි ක්‍රියාකාරකම් සඳහා බලාපොරොත්තු යහපත් මට්ටමක පවතී.

**ගෝලීය ප්‍රවණතා**

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| යුරෝපා කලාපය | අඩු වේගයකින් පහත වැටීමක් |
| ප්‍රංශය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ජර්මනිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| අයර්ලන්තය | කඩයිම් මට්ටමේ සිට පහත වැටීමක් |
| ඉතාලිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 ඔක්තෝබර් 28 වන දිනට*

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.
පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| තොග මිලදී ගැනුම් | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.